**නගර සහ කඩවත් ප්‍රාදේශීය සභාව**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශ

### 1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2015 මැයි 18 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මැයි 27 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 20 දින සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරන ලදි.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට **නගර සහ කඩවත් ප්‍රා**දේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

#### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 අනුව මූල්‍ය ප්‍රකාශයන් සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මුදල් පොත අනුව 2014 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් දෙකක ශේෂයන් ප්‍රමාණය රු.952,509 ක් සහ රු.316,334 ක් වුවත් මූල්‍ය ප්‍රකාශයන්හි එම ශේෂයන් පිළිවෙලින් රු.924,002 ක් සහ රු.644,591 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන්හි දක්වා තිබුණු බැවින් බැංකු ශේෂයන් රු.299,750 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කාර්ය මණ්ඩල ණය ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල ණය ශේෂය රු.4,776,097 ක් වූ අතර එදිනට මෙම ශේෂය මූල්‍ය ප්‍රකාශයන්හි රු. 6,753,993ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා කාර්යමණ්ඩල ණය ශේෂය රු.1,977,896 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 සිංහල-දෙමළ අළුත් අවුරුදු සමයේ පැවැත්වූ ක්‍රීඩා උත්සවය සඳහා රු.577,650 කට මිලදීගත් ද්‍රව්‍ය වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විවිධ තැන්පතු ලේඛනය අනුව 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.16,099,156 ක් වුවද, එදිනට වූ මෙම ශේෂය මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණේ රු.14,627,886 ක් වශයෙනි. එබැවින් කාර්ය මණ්ඩල ණය ශේෂය රු.1,471,270 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයට පෙර සේවකයන්ට දෙන ලද රු.309,702 ක් වූ කාර්ය මණ්ඩල අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු නොකොට දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂයට පෙර වෙනත් ආයතනයන්ට දුන් එකතුව රු.1,907,786 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) එකතුව රු.3,203,295 ක් වූ ආදායම් වර්ෂ 07 කට අධික කාලයක සිට හිඟ හිට තිබුණි. මෙම ශේෂය අයකර ගැනීමට පියවර නොගෙන දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි.

(ඈ) එකතුව රු.624,723 ක් වූ විවිධ ණයහිමි ශේෂ 14 ක් නිරවුල් නොකොට වර්ෂ 05 කට අධික කාලයක සිට හිඟ ලෙස දක්වා තිබුණි.

**1.2.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

----------------------------------------

මූල්‍ය ප්‍රකාශයන්හි වූ පහත සඳහන් එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

| ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ණය හිමියෝ | 701,048 | ණයහිමි ලෙජරය |
| විවිධ තැන්පතු | 14,627,886 | කාල විශ්ලේෂණය |

**1.2.5 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

----------------------------------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති - 1988 | | |
| (i) III පරිච්ඡේදයේ 81 වගන්තිය | - | එක් එක් කාර්තුව අවසානයේදී ඉඩම් අයිතිය වෙනස්වීම් පිළිබඳ මුද්දර ගාස්තු ආපසු ගෙවන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන්ද, වෙනත් ගනුදෙනු පිළිබඳ තීරු බදු ආපසු ගෙවන ලෙස මහා |

භාණ්ඩාගාරයේ අධ්‍යක්ෂවරයාගෙන්ද, දඩ මුදල් ආපසු ගෙවන ලෙස උසාවියේ රෙජිස්ට්‍රාර්වරයාගෙන්ද ඉල්ලීම් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

මුදල් රෙගුලාසි 880 - පරිපාලනමය වශයෙන් මුදල් සහ ගබඩා පිළිබඳව කටයුතු පවරා ඇති නිලධාරීන් 4 දෙනෙකුගෙන් සේවක ඇප ආඥා පනතේ 612 පරිච්ඡේදය ප්‍රකාරව ඇප ලබාගෙන නොතිබුණි.

(ඇ) නැගෙනහිර පළාත් මූල්‍ය රීති

(i) ප.මූ.රී 237 - වර්ෂයකට පෙර නිකුත් කළ එකතු වටිනාකම රු.21,375 ක් වූ චෙක්පත් 08 ක් මුදල් ලබාගැනීම පිණිස බැංකුවට ඉදිරිපත් කර නොතිබුණු නමුත්, මේ සම්බන්ධයෙන් අදාල රීති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන් අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රාදේශීය සභාවේ මෙහෙයුම්වලින් වියදම ඉක්ම වූ රු.9,402,844 ක් ආදායම් අතිරික්තයක් උද්ගත වී තිබුණු අතර එයට එරෙහිව ඉකුත් වර්ෂය සඳහා ආදායම ඉක්ම වූ රු.5,423,824 ක වියදම් අතිරික්තයක් ඇතිවී තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,826,668 ක වර්ධනයක් දැක්විණි.

### 2.2 ආදායම් කළමනාකරණය

---

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

---

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2014 දෙසැම්බර් 31 දිනට හිඟ ශේෂය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් සහ බදු | 8,970 | 8,241 | 2,658 |
| කුලී | 1,580 | 2,015 | 546 |
| බලපත්‍ර ගාස්තු | 11,704 | 9,449 | - |
| වෙනත් ආදායම් | 6,835 | 10,823 | - |
| | 29,089 | 30,528 | 3,204 |

2.2.2 **වරිපනම් සහ බදු**

------------------

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වූ ඉඩම් සහ ඉදිකරන ලද නිවාස සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් 2008 සිට 2014 දක්වා අයකරගත යුතු එකතුව රු.2,658,384 ක් වූ වරිපනම් අයකර ගැනීම පිණිස 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.3 **විදුලි සංදේශ කුළුණු සඳහා ගාස්තු අය කිරීම**

-----------------------------------------------

සභා බල ප්‍රදේශය තුළ 2007 සිට 2014 වර්ෂය දක්වා ස්ථාපනය කරන ලද විදුලි සංදේශ කුළුණු 08 ක් සඳහා ගාස්තු අය නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සභාවට රු.255,000 ක් වූ ආදායමක් අහිමි වී තිබුණි.

2.2.4 **උසාවි දඩ**

-----------

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණය විසින් අයකර ගන්නා ලද එකතුව රු.14,494,070 ක් වූ උසාවි දඩ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 **මුද්දර ගාස්තු**

-------------

2014 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු එකතුව රු.1,435,235 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3. **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නිර්නායක පාදක වැඩසටහන යටතේ ජීව කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 2013 ජුලි 02 දින රු.498,268 ක පිරිවැයකට බඳුන් 158 ක් මිලදීගෙන තිබුණ නමුත්, රු.331,127 ක් වටිනා බඳුන් 105 ක් ප්‍රතිලාභීන්ට නිකුත් නොකොට 2015 ජුනි 30 දින වනවිටත් ගබඩාවේ තබා තිබුණි.

(ආ) පුර නැගුම ව්‍යාපෘතිය යටතේ වෙන්කළ අරමුදල් වලින් රු.23,515,530 ක් වූ පිරිවැයකට ඉදිකොට 2012 සැප්තැම්බර් 26 දින සභාව වෙත භාරදෙන ලද වෙල්ලායිමනල් වෙළඳපොල 2015 ජුනි 30 දින වනවිටත් පොදු මහජනතාවගේ ප්‍රයෝජනය පිණිස භාරදී නොතිබුණි.

(ඇ) 2005 වර්ෂයට පෙර කියවන්නන්ට ලබාදුන් පුස්තකාල පොත් 3,196 ක් ආපසු ලබාගැනීම සඳහා සභාව කටයුතු කර නොතිබුණි.

(ඈ) 2009 සිට 2011 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන්ට කරන ලද ගෙවීම්වලින් අයකරගත් රු.356,723 ක් වූ රඳවාගැනීම් බදු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකොට විවිධ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඉ) වෙනත් දෙපාර්තමේන්තු වෙතින් පරිත්‍යාග ලෙස සභාවට ලැබුණු මෝටර් වාහන 08 ක් සභාව විසින් වර්ෂ 09 කට අධික කාලයක් භාවිතා කරමින් තිබෙන නමුත් ඒවායේ අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. **කොන්ත්‍රාත් පරිපාලනය**

(අ) වෙළඳපොල ගොඩනැගිල්ල ඉදිකිරීම

වෙළඳපොල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2011 දෙසැම්බර් 12 දින සභාව විසින් වටිනාකම රු.2,505,339 ක් වූ ගිවිසුමකට අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් විගණන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ගිවිසුම අනුව ගොඩනැගිල්ල මාස 03 ක් ඇතුළත නිමකළ යුතු වුවද, එය නිමකර තිබුණේ මාස 06 ක ප්‍රමාදයකින් පසුව 2012 සැප්තැම්බර් 26 දිනදීය. කෙසේ වුවද, ගිවිසුම ප්‍රකාරව ප්‍රමාණ කළ අලාභ අයකර ගෙන නොතිබුණි.

(ii) නියමිත පරිදි කොන්ක්‍රීට් අතුරා නොතිබූ බැවින් එහි පොළව ඉරිතැලී ගිලා බැස තිබුණු බව 2015 ජුනි 30 දින සිදුකළ විගණන පරීක්ෂණයේදී අනාවරණය විය. කෙසේ වුවද, කඩකාමර 12 කින් යුත් මෙම වෙළඳපොල ගොඩනැගිල්ලෙහි පොළව කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් රු.94,998 ක් ගෙවා තිබුණි.

(iii) වෙළඳපොලෙහි ඇතුළු වීමේ දොරටු දෙක සඳහා ගේට්ටු 04 ක් සවිකිරීම සඳහා රු.56,000 ක් ගෙවා තිබුණු නමුත් රු.28,000 ක් වටිනා ගේට්ටු 02 ක් පමණක් සවිකර තිබුණු බව 2015 ජනවාරි 02 දින සිදුකළ විගණන පරීක්ෂණයේදී අනාවරණය විය.

**5. මානව සම්පත් කළමනාකරණය**

2014 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| කාර්ය මණ්ඩල වර්ගය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| විධායක | 01 | 01 | - | - |
| සහායක | 27 | 23 | 04 | - |
| සුළු සේවක | 61 | 45 | 16 | - |
| වෙනත් | - | 70 | - | 70 |

කළමනාකරණ සහායක තනතුරක් සහ සුළු සේවක තනතුරු 16 ක් ඉකුත් වර්ෂ 05 ක කාලයක් තුළ පුරප්පාඩුව පැවතුණි.

6. **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

6.1 **අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම අතර සියයට 39 සිට සියයට 93 පරාසයක වූ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

7. **පද්ධති හා පාලන**

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) අත්තිකාරම් අයකර ගැනීම

(ඈ) ආදායම් රැස්කිරීම

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය